# කෘෂි නවෝදය උදෙසා ගොවිකටයුතු ආශ්‍රිත පර්යේෂණ

***හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දායකත්වය විමසීමක් ....***

**කෘ**ෂි ක්ෂේත්‍රයේ වර්ධනය රටේ ම සංවර්ධනයට පෙර නිමිත්තකැ යි කීම සත්‍යයකි. අනභිබවනීය කෘෂි ඉතිහාසයකට උරුමකම් කී නමුදු, අද අප හමුවේ ඇති දැවැන්ත අභියෝග නම් "බඩගින්දරට ආහාර" "පෝෂණයට ආහාර" "සුරක්ෂිතතාවයට ආහාර" කෙටියෙන් ම කියත හොත් "අපේ පැවැත්ම සඳහා ආහාර" යන්න යි. එය එසේ වන්නේ ලෝකයම අද දවසේ මෙන් ම හෙට දවසේ ද ආහාර අර්බුදයට මුහුණ දෙමින්, මුහුණදීමට සිදු ව ඇති බැවිනි. අපේ පැවැත්මට ආහාර අප ම සපයා ගත යුතු ය. ලෝකයාගෙන් ඉල්ලා ගැනීමට නො හැකි තරම් අර්බුදය බරපතල වී තිබේ. කෘෂිකර්මාන්තය නංවාලීමේ මූලික ම අවශ්‍යතාවයක් වන්නේ එහෙයිනි. අනෙක කෘෂිකර්මාන්තයේ හා බහුතර ගොවි ජනතාවගේ සාර්ථකත්වය ලෝකය තුළ ඉදිරි පිම්මක් පැනීමට ද තරම් වන නිසා ය.

උක්ත තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් වර්තමාන දේශීය නායකත්වය හා ප්‍රමුඛ පිරිවර සිදුකරන ලද කර්තව්‍යයන් රටේ කෘෂි ප්‍රබෝධයට කෙසේ ඉවහල් වී ඇත්දැ යි විමසීම වටින්නේ ය. විශේෂයෙන් ම "මහින්ද චින්තන - අලුත් ශ්‍රී ලංකාවක්" "අපි වවමු-රට නගමු, දේශීය ආහාර නිෂ්පාදන දිරිගැන්වීමේ ජාතික මෙහෙයුම්" ආශ්‍රිතව යෝජිත, ක්‍රියාත්මක, සාධිත කෘෂි වැඩසටහන් මෙහි දී ප්‍රමුඛ කොට ගත යුතු ය. වසර 38 ක් පුරා සාඩම්බර ඉතිහාසයකට උරුම කියන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය එම යුග මෙහෙවරට දායක වී ඇත්තේ කුමන පාර්ශ්වයක සිටිමින් ද යන්න අපි ඔබට පවසමු. විශේෂයෙන් ම "ගොවිජන සහ ග්‍රාමීය අංශයේ තිරසාර සංවර්ධනය සඳහා නව දැනුම ජනනය කර බෙදාහැරීම" යන ආයතනීය දැක්ම අනුව ගොවිකටයුතු ආශ්‍රිත සමාජ, ආර්ථික පර්යේෂණයන් හි නියැලෙමින් මෙරට කෘෂි නවෝදයට අත්වැල් සැපයීම අප අරමුණ යි. මෙතෙක් අප සිදු කොට ඇති එවැනි බොහොමයක් වූ පර්යේෂණයන් අතර මෑතක දී ම සිදුකරන ලද පර්යේෂණයන් ඊට සාක්ෂි සපයති.

## කෙතට දියවර

ජාතික වාරිමාර්ග සැලැස්මක් මගින් ගංගා, වැව්, අමුණු, ජල ධාරාවන් කළමනාකරණය කොට දකුණේ, උතුරේ, නැගෙනහිර, බටහිර වියළි බිම් හරිත ගැන්වීම "මහින්ද චින්තන" හා "මහින්ද චින්තන ඉදිරි දැක්ම" අරමුණ යි. ඊට අනුගතව අප ආයතනය මෑතක දී සිදු කළ පර්යේෂණ අධ්‍යයනයන් මෙසේ ය.

- නිල්වලා ගංගා ද්‍රෝණිය ආශ්‍රිත සමාජ, ආර්ථික විශ්ලේෂණය.
- ශ්‍රී ලංකාවේ ජල සම්පත හා ප්‍රශස්ත ජල භාවිතය.
- ශ්‍රී ලංකාවේ විවිධ අංශ කෙරෙහි ජලය බෙදීයාම: අත්දැකීම් අනුසාරයෙන් හැදෑරීම.
- ශ්‍රී ලංකාවේ කුඩා අමුණු පද්ධති පිළිබඳ අධ්‍යයනය.
- මතුපිටින් ගලා යන වැසි ජලය රැස් කිරීමේ නැඹුරුතාවය තක්සේරු කිරීම.
- වාරිමාර්ග කළමනාකරණය තුළ රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්වය, රිදීබැඳි ඇළ ගොවිසමාගම් ආකෘතිය ආශ්‍රිත ඇගයීම්.
- ග්‍රාමීය සංවර්ධනය සහ දුප්පත්කම අඩු කිරීම සඳහා ජලජ සම්පත් යොදා ගැනීම.
- පළාත් සභා ක්‍රමය තුළ වාරිමාර්ග විෂයයේ ක්‍රියාකාරිත්වය විමසීම.
- මහවැලි එච් කලාපයේ ජල පංගු බෙදීම පිළිබඳ ඇගයීම අධ්‍යයනය.
- ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කුඩා වැව්වල: විකාශනය, ස්ථානගත කිරීම, ව්‍යාප්තිය හා ඒවායින් ඉටුවන අත්‍යවශ්‍ය ම සේවා.
- ආයතනික මට්ටමේ වැසි දිය එක්රැස් කිරීම පිළිබඳ ආර්ථික ඇගයීම.

## වගාවට ඉඩම්

ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් සකසන මහින්ද චින්තන අරමුණු මහවැලි යෝජනා ක්‍රමවල ගොවි ජනපදවල ගොවීන්ට ඉඩම් ලබාදීමත්, ගොවි බිම්වල සින්නක්කර අයිතිය තහවුරු කිරීමත් අරමුණු කොට ඇත. ඉඩම් යන්න ගොවියා සතු ප්‍රධානත ම යෙදවුම යි. ඉඩම්වලින් තොරව කෘෂි කර්මාන්තය පිළිබඳ කවර නම් කතා ද? මේ සියල්ල පාදක කොට ගනිමින් අප විසින් සිදු කරන ලද අධ්‍යයන ක්ෂේත්‍රයන් මෙසේ ය:

- ශ්‍රී ලංකාවේ ගොවි ජනපද ව්‍යාපාරයන් හි පවත්නා අවිධිමත් ඉඩම් ගනුදෙනු ක්‍රම, එහි නිෂ්පාදනය සහ ජානපදිකයන්ගේ ආයෝජන හා ආදායම් කෙරෙහි කරනු ලබන බලපෑම විමසීම.
- ශ්‍රී ලංකාවේ කුඩා ඉඩම් අංශයේ තත්ත්වය පිළිබඳ ඇගයීම.
- පළාත් සභා ක්‍රමය තුළ ඉඩම් විෂයයේ ක්‍රියාකාරීත්වය විමසීම.

### කෘෂි යෙදවුම් හා සේවා

කෘෂි නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ප්‍රධාන බාධාවන් වන යෙදවුම් (බීජ, පොහොර, කෘෂි රසායන) හා සේවා (ණය, රක්ෂණ, අලෙවි) නිසි කලට නිවැරදිව නො ලැබෙන බව "අපි වවමු-රට නගමු" වැඩසටහනෙන් කියැවේ.

කෘෂි හා වැවිලි කර්මාන්තයේ වර්ධනය තකා රසායනික පොහොර කිලෝග්‍රෑම් 50 ක බෑගයක් රුපියල් 350.00 කට ලබාදීමේ කටයුත්ත ඉදිරියට ගෙන යමින් වී හා එළවළුවලට පමණක් නොව අනෙකුත් භෝගවලට ද එම සහනාධාරය ලබාදීමට මේ වන විට කටයුතු සූදානම් ය. රසායනික පොහොර භාවිතය පරිසර හිතකාමී අන්දමින් සිදු කිරීම ඇතුළු කටයුතු මැද්දේ ම කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරිගැන්වීම ද අඛණ්ඩව ම සිදු කෙරේ. එසේ ම වගා රක්ෂණය, ගොවි විශ්‍රාම වැටුප් පිළිබඳව ද එහි සඳහන් ය. ඊට අදාළ ව අප ආයතනය විසින් සිදු කරන ලද පර්යේෂණ කර්තව්‍යයන් මෙසේ යි.

- සුළු ගොවීන් සඳහා ලබාදෙන නව පොහොර සහනාධාරය ඇගයීම.
- කාබනික පොහොර භාවිතයේ ගැටළු හා බාධක හඳුනා ගැනීම.
- කෘෂිරසායනික ද්‍රව්‍ය සඳහා මිල ආන්තිකයන් විශ්ලේෂණය කිරීම පිළිබඳ අධ්‍යයනය.
- ක්ෂුද්‍ර ව්‍යවසායකත්වය සඳහා මූල්‍ය සේවාවල බලපෑම පිළිබඳ අධ්‍යයනය.
- ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික රක්ෂණ සැලැසුම ඇගයීම.
- ශ්‍රී ලංකාවේ ආහාර භෝග අංශයෙ හි කෘෂිකාර්මික යෙදවුම් වෙළෙඳපොල කෙරෙහි ගෝලීය ආර්ථික අර්බුදයේ බලපෑම.
- වී මෝල් කර්මාන්තය පිළිබඳ දත්ත පදනම.
- 2005/2006 මහ කන්නයේ වී මිල දී ගැනීමේ රජයේ වැඩසටහන ඇගයීම.
- වී සහ සහල් මිල වැඩිවීම සඳහා හේතු - 2007.
- රජයේ වී මිලට ගැනීමේ වැඩසටහන ඇගයීම 2000, 2006 සහ 2007.
- ශ්‍රී ලංකාවේ වී වගා අංශයේ වෙළෙඳ අනුපාතය වෙනස්වීම පිළිබඳ විමසීම.
- ආහාර තොරතුරු හා වෙළෙඳපොළ දැනුවත් කිරීම පිළිබඳ ව්‍යාපෘතිය (සතිපතා, මාස්පතා, ආහාර ද්‍රව්‍ය විවරණිකාව).
- ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවල පොළ වෙළෙඳපොළ සංවර්ධනය.
- ආහාර සුරක්ෂිතතාවය සඳහා වන ජාතික වැඩසටහන යටතේ ආහාර අලෙවිය සංවර්ධනය සඳහා යෝජනා.
- අතිරේක ආහාර භෝග නිෂ්පාදනය හා අලෙවිය පිළිබඳ අධ්‍යයනය.
- සුපිරි වෙළෙඳසැල මගින් එළවළු බෙදාහැරීමේ ක්‍රියාවලිය හා එමගින් ගොවීන්ට සිදුවන බලපෑම් අධ්‍යයනය.

### දේශීය නිෂ්පාදන

කලක පටන් දේශපාලන ක්ෂේත්‍රය තුළ ද දැඩි කතාබහට ලක්වූයේ දේශීය නිෂ්පාදනය වැඩි කරලීමේ ජාතික මෙහෙයුම පිළිබඳ ව ය. විශේෂයෙන් ම ආහාර සුරක්ෂිතතාවය සඳහා තෙත් කලාපයේ පුරන් කුඹුරු අස්වැද්දීම හා ගෙවතු වගාව ප්‍රචලිත කිරීම, වසවිස නැති ආහාර දිරිගැන්වීම, පසු අස්වනු හානිය අවම කිරීම, දේශීය ආහාර නිෂ්පාදන දිරිගැන්වීම තුළ වී අතිරේක භෝග, පලතුරු, එළවළු, අල, කුළුබඩු වගාව සංවර්ධනය පිළිබඳ කතිකාවට ලක් විය. ඒ සඳහා අප ආයතනයෙන් සපිරි පර්යේෂණ කාර්යභාරය පහත දැක්වේ.

- ශ්‍රී ලංකාවේ ශ්‍රී ක්‍රමයට වී වගා කිරීමේ ක්‍රමය පිළිබඳ වර්තමාන තත්ත්වය විමසීම.
- ශ්‍රී ලංකාවේ තෙත් කලාපයේ වගා කරන කුඹුරු ඉඩම් ප්‍රමාණය අඩුවීමේ ප්‍රවණතා අධ්‍යයනය.
- උඩරට එළවළු වගා පද්ධතිය තුළ සංරක්ෂිත ගොවිතැන් ක්‍රම විසරණය පිළිබඳ අධ්‍යයනය.
- ආහාර මිල ඉහළ යාම ගෘහ ඒකකවල ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් දක්වන බලපෑම අධ්‍යයනය.

23 වැනි පිටුවට ...

**වත්සලා ගමගේ**
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිණි
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

## කෘෂි නවෝදය උදෙසා ........

- ජාතික ආහාර නිෂ්පාදන මෙහෙයුම "අපි වවමු-රට නගමු" වැඩසටහන ඇගැයීම
- දේශීය ආහාර නිෂ්පාදන වගාවේ ගෙවතු වගා සංවර්ධන ප්‍රගතිය පිළිබඳ අධ්‍යයනය.
- ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරු අලෙවිකරණය සඳහා ප්ලාස්ටික් ඇසුරුම් භාවිතා කිරීමේ බලපෑම් පිළිබඳ අධ්‍යයනය.

### කිරි ඉතුරුම

මෙරට "කිරෙන් උතුරන රටක් කිරීම" යන්න මහින්ද චින්තනයේ ප්‍රමුඛ කොට ගැනුණකි. විශේෂයෙන් ම දියර කිරි පරිභෝජනය හා අලෙවිය දිරිගන්වන බවත්, කිරි ගොවියා ශක්තිමත් කරන බවත් මහින්ද චින්තනයේ සඳහන් ය. ඒ සඳහා අප විසින් ලබා දෙන ලද අනුග්‍රහය මෙසේ යි.

- කිරිගම්මාන සංවර්ධන ව්‍යාපෘතියේ මධ්‍යකාලීන ඇගයීම.
- උඩවලව වනෝද්‍යානයේ ගවයින් ඉවත් කිරීම සහ රුහුණු කිරිගව ගැටළුව පිළිබඳ අධ්‍යයනය.
- කුරුණෑගල දිස්ත්‍රික්කයේ කිරි නිෂ්පාදන පිරිවැය සඳහා බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය.
- අඩු ආදායම්ලාභී පවුල්වල වෙසෙන මන්ද පෝෂණයෙන් පෙළෙන වයස මාස 24-60 දක්වා දරුවන්ට කිරි වීදුරුවක් ලබාදීමේ වැඩසටහන ඇගයීමේ අධ්‍යයනය.

### ව්‍යාප්ති සේවාව

කෘෂි ව්‍යාප්ති සේවාව නැවතත් ගමට ගෙනියන බව මහින්ද චින්තනය පවසයි. විශේෂයෙන් ම අප ආයතනය සතු මානව හා භෞතික සම්පත් පෙරටු කරගෙන ව්‍යාප්ති සේවයේ නිරත වූවන් පුහුණු කිරීම කලක පටන් ම සිදු වේ. එමගින් ජාතික කෘෂි සැලසුම් කරා අප දක්වා ඇති දායකත්වයට පහත සාක්ෂ්‍ය ප්‍රමාණවත් ය.

- කෘ. ප. නි. ස. වරුන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන.
- ගැමි පිවිසුම් ක්‍රමවේදය භාවිතා කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන.
- වාරි පුබුදුව ව්‍යාපෘතියේ සමාජ සජීවීකරුවන් පුහුණු කිරීමේ ව්‍යාපෘතිය.
- කෘෂිකර්ම අලෙවිකරණ ව්‍යාප්ති සේවය පිළිබඳ ජාතික පුහුණු වැඩසටහන.
- වැඩිහිටි පුහුණු ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩසටහන.

ඉදිත් මේ හැර, කෘෂි තාක්ෂණය, තොරතුරු සන්නිවේදන තාක්ෂණය හරහා ගොවීන්ට දැනුම සන්නිවේදනය කිරීම පිළිබඳව ද අප ආයතනයේ අවධානයට පාත්‍ර වී ඇත.

ගොවිකටයුතු ක්ෂේත්‍රයේ පර්යේෂණයන් හි නියැළෙමින් ජාතික සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ අප මෙහෙවර තවත් කාලාන්තරයක් පුරා සිදුවනු ඇත. එහි සැබෑ ශක්තිය අප උකහා ගන්නේ ගොවිජනතාව ගෙනි. ඒ ශක්තිය ජාතික සංවර්ධනය දක්වා පරිවර්තනය කිරීමට අපි නිබඳ කැපවන බව නම් සහතික වෙමු.